කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

முகாமைத்துவசேவைகள் திணைக்கள

DEPARTMENT OF MANAGEMENT SERVICES

# වාර්ෂික කාර්ය සාධන වාර්තාව

# வருடாந்தசெயலாற்றுஅறிக்கை

# ANNUAL PERFORMANCE REPORT

# 2018

මහා භාණ්ඩාගාරය, කොළඹ - 01

பொதுத்திறைசேரி, கொழும்பு - 01

General Treasury, Colombo - 01

දුරකථන
தொலைபேசி : 011 – 2484757
**Telephone**

ෆැක්ස්
தொலைநகல் : 011 – 2430270
**Fax**

ඊ - මේල්
மின்னஞ்சல் : dgms@msd.treasury.gov.lk
**e – mail**

# කාර්ය සාධන වාර්තාව

# 2018

## කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව


මුදල් අමාත්‍යාංශය
කොළඹ01
ශ්‍රී ලංකාව

දුරකථන : 011 - 2484757
ෆැක්ස් : 011 - 2430270
ඊ-මේල්: dgms@msd.treasury.gov.lk

## අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

ආර්ථික සංවර්ධනය ඉලක්ක කර ගනිමින් රාජ්‍ය අංශයේ සමස්ත මානව සම්පත ප්‍රශස්ත ආකාරයෙන් කළමනාකරණය කිරීමේ සුවිශේෂී වගකීම පෙරදැරි කර ගෙන 2018 වර්ෂයේ දී මෙරට රාජ්‍ය අංශයේ මානව සම්පත් කළමනාකරණය පිළිබඳ සුවිශේෂී ඉදිරි පියවර රැසක් තැබීමට මෙම දෙපාර්තමේන්තුවට හැකි වී ඇත. ඒ තුළින්, ක්‍රමිකව ගොඩනැගෙන රාජ්‍ය සේවයේ විශිෂ්ටත්වය වෙනුවෙන් ප්‍රමුඛ දායකත්වයක් ලබා දීමට හැකි වීම අතිශයින් වැදගත් වේ.

පසුගිය වර්ෂයේදී රාජ්‍ය අංශයේ මානව සම්පත් කළමනාකරණය විධිමත් කිරීමෙහි ලා කේන්ද්‍රීය තොරතුරු පද්ධතියක් නිර්මාණය කිරීමෙහි සුවිශේෂී කාර්ය වෙනුවෙන් රාජ්‍ය අංශයේ කාර්ය මණ්ඩල තොරතුරු කාර්තුමය වශයෙන් යාවත්කාලීන කර පවත්වාගෙන යාමට හැකි වීම, රාජ්‍ය අංශයේ සියලුම ආයතනවල කාර්යමණ්ඩල තොරතුරු මුද්‍රිත ප්‍රකාශන වශයෙන් එළිදැක්වීමට හැකිවීම සහ රාජ්‍ය අංශයේ සමස්ත ආයතනික යාන්ත්‍රණය කේන්ද්‍රකොට ගනිමින් කාර්ය මණ්ඩල සමාලෝචනය පිළිබඳ ප්‍රතිපත්තීන් සම්පාදනය කිරීමට හැකිවීම ද වඩාත් වැදගත් වේ.

මෙම දෙපාර්තමේන්තුවේ මෙහෙවර මැනවින් ඉටුකිරීම උදෙසා නිසි මග පෙන්වීම් හා උපදේශකත්වය ලබා දුන් මුදල් අමාත්‍යාංශයේ හා මහා භාණ්ඩාගාරයේ ලේකම් ආචාර්ය ආර්.එච්.එස්. සමරතුංග මැතිතුමාට, මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරුන්ට සහ මහා භාණ්ඩාගාර දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට මාගේ ප්‍රණාමය පුද කරමි. තවද රාජ්‍ය අංශයේ මානව සම්පත් කළමනාකරණයේ දී අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණය ගැනීම උදෙසා සහයෝගයෙන් මෙන්ම සහජීවනයෙන් නිරන්තරයෙන්ම කටයුතු කළ රාජ්‍ය අංශයේ සියලු ආයතනයන්ට ද, දැඩි කැපවීමෙන් හා කණ්ඩායම් හැඟීමෙන් දෙපාර්තමේන්තුවේ කාර්යභාරය සාධනීය ලෙස ඉටුකිරීමට දායකත්වය ලබා දුන් 2018 වසර තුළ මෙම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ලෙස කටයුතු කළ වත්මන් මුදල් අමාත්‍යාංශ අතිරේක ලේකම් එච්.ජී.සුමනසිංහ මහතාට ද මෙම දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයටද ප්‍රශංසාව පිරිනමමි.

මෙතෙක් ආ ගමන් මග තුළ අප ලත් අත්දැකීම් පෙරදැරි කරගෙන සමස්ත රාජ්‍ය සේවය විශිෂ්ටත්වය කරා ගෙන ඒම උදෙසා සේවක සංඛ්‍යා කළමනාකරණය, පාරිශ්‍රමික කළමනාකරණය හා උපදේශකත්වය පිළිබඳ ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය බවට පත් වීමට සියලු දෙනාගේම සහයෝගය සහ කැපවීම තවදුරටත් අපේක්ෂා කරමි.

**තමරා ඩී. පෙරේරා**

**අධ්‍යක්ෂ ජනරාල්**

# පටුන

1. ආයතන ව්‍යුහය ..........................................................................................................01

2. කාර්ය මණ්ඩල කළමනාකරණය ..........................................................................................06

3. කාර්ය මණ්ඩල සමාලෝචනය - 2018 ..................................................................................15

4. වැටුප් හා පාරිශ්‍රමික කළමනාකරණය ...................................................................................18

5. පර්යේෂණ, නිරීක්ෂණ ඉදිරිපත් කිරීම හා කමිටු නියෝජනය ...............................................20

6. ආයතන අංශය.................................................................................................................23

7. මූල්‍ය අංශය ....................................................................................................................28

# 01. ආයතන ව්‍යුහය

## 1.1 හැඳින්වීම.

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය යටතේ 1999 වර්ෂයේ දී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව ස්ථාපනය කරනු ලැබීය. එතැන් සිට ජාතික, පළාත්, දිස්ත්‍රික් හා පළාත් පාලන මට්ටමින් රාජ්‍ය අංශයේ සේවා අවශ්‍යතාවයන් පදනම් කර ගනිමින් ආයතනික මට්ටමින් අවශ්‍ය වන ප්‍රශස්ත කාර්ය මණ්ඩලය හඳුනා ගනිමින්, එසේ හඳුනා ගන්නා කාර්ය මණ්ඩලවලට අදාළ වැටුප් සම්බන්ධයෙන් තීරණ ගැනීම සහ රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතන හා සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල බඳවා ගැනීම් /උසස් කිරීම් පරිපාටි සඳහා අනුමැතිය ලබාදීම ආදී කටයුතු මගින් රාජ්‍ය අංශයේ මානව සම්පත ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ උපරිම දායකත්වය ලබා දී ඇත. මෙහිදී රාජ්‍ය මූල්‍ය තත්ත්වය, සංවර්ධන විභවතාවය, කුසලතා පූර්ණ රාජ්‍ය සේවයක් ඇති කිරීම වැනි අංශ කෙරෙහි සුවිශේෂී අවධානයක් යොමු කිරීම අත්‍යවශ්‍ය විය. මේ සඳහා කාලීන අවශ්‍යතා පරිදි අදාළ අනෙකුත් ආයතන සමඟ ද මනා සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින් කාර්ය මණ්ඩල සමාලෝචන තුළින් රාජ්‍ය අංශයට අවශ්‍ය ප්‍රශස්ත මානව සම්පත පවත්වා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව ඉහළ දායකත්වයක් ලබා දී ඇත.

## 1.2 දැක්ම, මෙහෙවර සහ පරමාර්ථ.

### දැක්ම

රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යා කළමනාකරණය, පාරිශ්‍රමික කළමනාකරණය හා උපදේශකත්වය පිළිබඳ ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය වීම.

### මෙහෙවර

රාජ්‍ය සේවය විශිෂ්ට මට්ටමින් පවත්වාගෙන යාමට අවශ්‍ය ප්‍රශස්ත තනතුරු ප්‍රමාණ රාජ්‍ය ආයතන වෙත ලබාදීම.

**පරමාර්ථ**

රාජ්‍ය අංශයෙහි මානව සම්පත් කළමනාකරණය සඳහා මූලික පරමාර්ථ කිහිපයක් යටතේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව කටයුතු කරනු ලබයි.

i. රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යා කළමනාකරණය.

ii. ජාතික වැටුප් ප්‍රතිපත්තීන්ට අනුකූලව වැටුප් හා දීමනා තීරණය කිරීම.

iii. රාජ්‍ය අංශයේ ප්‍රශස්ත සේවක සංඛ්‍යා පිළිබඳව අධ්‍යයන සිදු කිරීම.

## 1.3 කාර්යභාරය.

i. රාජ්‍ය අංශයට අවශ්‍ය කාර්ය මණ්ඩලය හඳුනා ගැනීම.

ii. රාජ්‍ය අංශයේ ආයතනවල මෙහෙවර සහ අරමුණු අනුව ප්‍රශස්ත කාර්ය මණ්ඩල අවශ්‍යතාවය හඳුනා ගැනීම මගින් පද්ධති සහ ක්‍රමවේද හඳුන්වාදීම උදෙසා කාර්ය මණ්ඩල සමාලෝචන සිදු කිරීම.

iii. රාජ්‍ය අංශයේ ආයතනවල යටපත් කළ යුතු තනතුරු සහ තනතුරු ප්‍රතිශෝධනයන් හඳුනා ගනිමින් තනතුරු ඇති කිරීම සහ පුරප්පාඩු පිරවීමට අනුමැතිය ලබා දීම.

iv. රජයේ ව්‍යාපෘති සඳහා කාර්ය මණ්ඩල අනුමැතිය ලබා දීම සහ වැටුප් නිර්ණය කිරීම.

v. රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ පූර්ණ වශයෙන් රජයට අයිති සමාගම්වල බඳවා ගැනීමේ පටිපාටි සහ උසස් කිරීමේ පටිපාටි සඳහා අනුමැතිය ලබා දීම.

vi. කාර්ය මණ්ඩල අවශ්‍යතාවන් සලකා නිර්ණායකයන් සහ ප්‍රමිතීන් වැඩිදියුණු කිරීම / රාජ්‍ය අංශයේ තනතුරු සඳහා නිර්ණායකයන් සහ ප්‍රමිතීන් වැඩි දියුණු කිරීම.

vii. අතිරික්ත කාර්ය මණ්ඩල හඳුනා ගැනීම, ඔවුන් ඵලදායි ලෙස යෙදවීම සහ සේවාවන් සංශෝධනය හා අත්හිටුවීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීම.

viii. භෞතික පරිසර ප්‍රවර්ධනය කිරීමේ අවශ්‍යතාවය සහ යාන්ත්‍රීකරණය / ස්වයංක්‍රීය කළ යුතු, පරිගණක ගත කළ යුතු සහ බාහිරින් ලබාගත යුතු ක්ෂේත්‍ර හඳුනා ගැනීම.

ix. සේවා ව්‍යවස්ථා හා සේවා කොන්දේසිවල සංවර්ධන අවශ්‍යතා පිළිබඳ අවධානය යොමු කරමින් අධ්‍යයනය කිරීම / සමාලෝචනය කිරීම.

x. රාජ්‍ය අංශයට විශ්‍රාමික නිලධාරීන් නැවත සේවයෙහි නිරත කරවීම සහ උපදේශකවරුන් පත් කිරීම පිළිබඳ අමාත්‍ය මණ්ඩල යෝජනා මනාව අධ්‍යයනය කිරීමෙන් පසු අදාළ නිර්දේශ ලබා දීම.

xi. රාජ්‍ය සේවයේ සහ පළාත් රාජ්‍ය සේවයේ කාර්ය මණ්ඩල තොරතුරු පද්ධති නඩත්තු කිරීම.

xii. බඳවා ගැනීම් ප්‍රතිපත්ති, නිපුණතා සංවර්ධන පුහුණු සහ සැලසුම් අනුපිළිවෙල මෙන්ම එවැනි කරුණු ක්‍රියාත්මක කිරීම උදෙසා අදාළ බලධාරීන් වෙත අවශ්‍ය සහයෝගය ලබාදීම පිළිබඳ අධ්‍යයන සිදු කිරීම.

xiii. රාජ්‍ය අංශයේ වැටුප්, දිරි දීමනා යෝජනා ක්‍රම, සුභසාධන යෝජනා ක්‍රම සහ එවැනි අනෙකුත් පාරිශ්‍රමික යෝජනාවල කළමනාකරණය සහ රාජ්‍ය අංශයේ විශ්‍රාම ගැන්වීමේ ප්‍රතිලාභ පිළිබඳ යෝජනාක්‍රම පිළිබඳ අධ්‍යයනය කිරීම සහ නිරීක්ෂණ ලබාදීම.

xiv. රාජ්‍ය ආයතනයන් ප්‍රතිව්‍යුහගත කිරීම සහ ප්‍රමාණකරණය කිරීමේ අරමුණු ඇතිව රාජ්‍ය අංශයේ ආයතනවල කාර්යයන් ද්විත්වකරණය වීම හඳුනාගැනීම.

xv. පළාත් සභා සහ පළාත් රාජ්‍ය ආයතනවල ආයතනික සමාලෝචන, කාර්ය මණ්ඩල කළමනාකරණය, වැටුප් පිළිබඳ උපදේශන සේවාවන් ලබාදීම.


xvi. කාර්තුමය වශයෙන් යාවත්කාලීන කරන ලද රාජ්‍ය අංශයේ කාර්ය මණ්ඩල තොරතුරු වාර්තා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම.

xvii. රාජ්‍ය සේවයේ කාර්ය මණ්ඩලය පිළිබඳව වාර්ෂිකව වාර්තාවක් පිළියෙළ කිරීම සහ ප්‍රකාශන පළ කිරීම.

xviii. රාජ්‍ය සේවයේ කාර්ය මණ්ඩලය පිළිබඳව සහ එම කාර්ය මණ්ඩලයේ වැටුප් හා දීමනා ගෙවීම පිළිබඳව වාර්ෂික වාර්තා පිළියෙල කිරීම සහ ප්‍රකාශන පළ කිරීම.

## 1.4 සංවිධාන ව්‍යුහය.

## කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව



## 1.5 ප්‍රධාන අංශ.

-

1. රාජ්‍ය ආයතන හා ව්‍යවස්ථාපිත ආයතන සඳහා කාර්ය මණ්ඩල අනුමත කිරීමේ අංශය.
2. අමාත්‍ය මණ්ඩල අංශය.
3. තොරතුරු තාක්ෂණ අංශය.
4. බඳවා ගැනීමේ පරිපාටි අංශය.
5. තොරතුරු දැනගැනීමේ පනත අංශය.
6. පාලන අංශය.
7. ගිණුම් අංශය.

# 02. කාර්ය මණ්ඩල කළමනාකරණය

## 2.1 හැඳින්වීම.

රාජ්‍ය අංශයේ මානව සම්පත් කළමනාකරණයේ දී, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් පහත පරිදි වේ.

- තනතුරු අනුමත කිරීම.
- පුරප්පාඩු පිරවීම අනුමත කිරීම.
- තනතුරු යටපත් කිරීම.
- තනතුරු නාම සංශෝධනය කිරීම.
- රජයේ ව්‍යාපෘතීන් සඳහා කාර්ය මණ්ඩල අනුමත කිරීම හා වැටුප් තීරණය කිරීම.
- රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල බඳවා ගැනීම් හා උසස් කිරීම් පරිපාටි අනුමත කිරීම.

රාජ්‍ය අංශය වෙත පැවරී ඇති කාර්යභාරය නිසි පරිදි ඉටු කිරීම සඳහා ප්‍රශස්ත සේවක සංඛ්‍යාවක් පවත්වා ගතයුතු වේ. ඒ අනුව රටේ ආර්ථික සංවර්ධන ඉලක්කයන් හා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා හා පළාත් පාලන ආයතන, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා සම්පූර්ණයෙන් රජය සතු සමාගම් හා රජයේ ව්‍යාපෘතීන්හි කාලීන මානව සම්පත් අවශ්‍යතාවයන් ද සැලකිල්ලට ගෙන ආයතන තුළ ප්‍රශස්ත තනතුරු සංඛ්‍යාවක් පවත්වා ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව 2018 වර්ෂය තුළ ද සිය කාර්යභාරය මැනවින් ඉටු කරන ලදී.

## 2.2 පරිපාලන මට්ටම අනුව රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය.

රාජ්‍ය අංශයේ සමස්ත සේවා නියුක්තිය 2018.12.31 දිනට **1,370,633**ක් විය. අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා, පළාත් පාලන ආයතන, ආරක්ෂක අංශ, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා සම්පූර්ණයෙන් රජය සතු සමාගම්, රාජ්‍ය බැංකු හා මූල්‍ය ආයතන ඇතුළත් රාජ්‍ය ව්‍යවසායන්ගෙන් සමන්විත රාජ්‍ය අංශයේ සමස්ත කාර්ය මණ්ඩල සංයුතිය පහත 2.1 වගුව මගින් දැක්වේ.

වගුව 2.1 : රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය - 2018.

| පරිපාලන මට්ටම | අනුමත තනතුරු සංඛ්‍යාව | සත්‍ය සේවක සංඛ්‍යාව |
|---|---|---|
| ජාතික | 892,509 | 742,960 |
| පළාත් සභා හා පළාත් පාලන ආයතන | 440,560 | 392,528 |
| **සමස්ත රාජ්‍ය සේවය** | **1,333,069** | **1,135,488** |
| රාජ්‍ය ව්‍යවසායන් හා රාජ්‍ය බැංකු | 248,625 | 235,145 |
| **සමස්ත රාජ්‍ය අංශය** | **1,581,694** | **1,370,633** |

මූලාශ්‍රය : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

## 2.3 රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යා කළමනාකරණය - 2018.

මහජනතාව වෙත කාර්යක්ෂම හා ඵලදායී රාජ්‍ය සේවයක් සැපයීම අරමුණු කර ගනිමින් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා හා පළාත් පාලන ආයතන ඇතුළත් රාජ්‍ය අංශය සඳහා 2018 වසර තුළ දී ප්‍රශස්ත සේවක සංඛ්‍යාවක් පවත්වාගෙන යාමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව කටයුතු කර ඇත.

### 2.3.1 තනතුරු අනුමත කිරීම - 2018.

නව තනතුරු අනුමත කිරීමේ දී අදාල ආයතනවලට පැවරී ඇති කාර්යභාරය, රාජ්‍ය මූල්‍ය ශක්‍යතාවය මෙන්ම තනතුරු ඇති කිරීමේ කාලීන අවශ්‍යතාවය ද සැලකිල්ලට ගන්නා ලදී.

පසුගිය දශකය තුළ සමස්ත රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු 2.2 වගුවෙන් දැක්වේ.

**වගුව 2.2 : රාජ්‍ය අංශයේ කාර්ය මණ්ඩල සංයුතිය 2009 -2018.**

| පරිපාලන මට්ටම | | වර්ෂය | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
| ජාතික | අනුමත | 680,442 | 698,335 | 705,331 | 710,909 | 796,266 | 844,948 | 858,680 | 874,046 | 880,971 | 892,509 |
| | තත්‍ය | 607,717 | 643,748 | 443,399 | 661,837 | 683,719 | 703,600 | 722,950 | 754,548 | 756,339 | 742,960 |
| පළාත් සභා සහ පළාත් පාලන ආයතන | අනුමත | 364,396 | 367,207 | 367,730 | 385,562 | 391,647 | 392,698 | 394,812 | 412,560 | 428,433 | 440,560 |
| | තත්‍ය | 296,714 | 332,107 | 363,248 | 378,933 | 375,752 | 377,445 | 374,330 | 372,033 | 385,311 | 392,528 |
| **සමස්ත රාජ්‍ය සේවය** | **අනුමත** | **1,044,838** | **1,065,542** | **1,073,061** | **1,096,471** | **1,187,913** | **1,227,646** | **1,253,492** | **1,286,606** | **1,309,404** | **1,333,069** |
| | **තත්‍ය** | **904,431** | **957,855** | **1,006,647** | **1,040,770** | **1,059,471** | **1,081,045** | **1,097,280** | **1,126,581** | **1,141,650** | **1,135,488** |
| රාජ්‍ය ව්‍යවසාය සහ බැංකු | අනුමත | 227,224 | 227,792 | 228,326 | 245,100 | 245,687 | 245,339 | 244,800 | 234,220 | 242,194 | 248,625 |
| | තත්‍ය | 234,547 | 236,121 | 236,543 | 239,079 | 239,058 | 221,213 | 219,583 | 226,695 | 233,849 | 235,145 |
| **සමස්ත රාජ්‍ය අංශය** | **අනුමත** | **1,272,072** | **1,293,334** | **1,301,387** | **1,341,571** | **1,433,600** | **1,682,985** | **1,498,292** | **1,520,826** | **1,551,598** | **1,581,694** |
| | **තත්‍ය** | **1,138,978** | **1,211,976** | **1,243,190** | **1,279,849** | **1,298,529** | **1,302,258** | **1,316,863** | **1,353,276** | **1,375,499** | **1,370,633** |
| අනුමත සේවක සංඛ්‍යාවේ උපයෝජනය(%) | | 90 | 94 | 96 | 95 | 91 | 88 | 88 | 88 | 88 | 86 |

මූලාශ්‍රය - කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

ඒ අනුව රාජ්‍ය අංශයෙහි පුළුල් වන සේවා අවශ්‍යතාවයන්ට අනුගත වෙමින් 2009 වර්ෂයට සාපේක්ෂව 2018 වර්ෂයේ දී රාජ්‍ය අංශයෙහි අනුමත සේවක සංඛ්‍යාව 34% කින් ඉහළ නැංවී ඇත. කෙසේ වුව ද, බඳවා ගැනීම් සහ විශ්‍රාම ගැනීම් අතර පරතරය වැඩිවීම හේතුවෙන් 2018 වර්ෂයෙහි අනුමත කාර්යය මණ්ඩලයෙන් තත්‍ය වශයෙන් උපයෝජනය කර ඇත්තේ සියයට අසූ හයක් (86%) පමණි. 2.2 වගුව අනුව 2009 සිට 2018 වර්ෂය දක්වා දස වසර තුළ අනුමත කාර්ය මණ්ඩලයේ වැඩිම උපයෝජනය දක්වා ඇත්තේ 2011 වර්ෂයේදී ය.

### 2.3.2 තනතුරු පුරප්පාඩු පිරවීමට අනුමැතිය ලබා දීම හා තනතුරු යටපත් කිරීම.

කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 03/2014 හි විධිවිධාන අනුව රාජ්‍ය සේවයේ සහ පළාත් පාලන ආයතන ඇතුළුව පළාත් රාජ්‍ය සේවයේ තනතුරුවල ඇතිවන පුරප්පාඩු පිරවීම අදාළ රේඛීය අමාත්‍යාංශ ලේකම්/ පළාත් ප්‍රධාන ලේකම්ගේ පූර්ව අනුමැතිය මත සිදු කළ අතර, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල ඇතිවන පුරප්පාඩු පිරවීම සේවයේ අවශ්‍යතාවය සලකා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇත.

කළමනාකරණ සේවා චක්‍රලේඛ 03/2018 හි විධිවිධාන අනුව රාජ්‍ය සේවයේ හා ව්‍යවස්ථාපිත ආයතනවල සියලුම තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගතයුතු බව දන්වා ඇත.

### 2.3.3 ව්‍යාපෘති කාර්ය මණ්ඩල සහ වැටුප් කළමනාකරණය.

ජාතික හා පළාත් මට්ටමින් රට තුළ ක්‍රියාත්මක වන විවිධ සංවර්ධන ව්‍යාපෘති, සැලසුම්ගත කාල වකවානු තුළ නිම කිරීමට අවශ්‍ය වන කාර්ය මණ්ඩල සඳහා අනුමැතිය ලබා දීම හා එම තනතුරුවලට අදාල වැටුප් තීරණය කිරීම 2007.04.05 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 33හි විධිවිධාන අනුව **2007** වර්ෂයේ සිට **2016** වර්ෂය දක්වා සිදු කරනු ලැබිණි. සංවර්ධන ප්‍රමුඛතාවයන් මත ඉලක්කගත ආර්ථික සංවර්ධන කටයුතු පහසු කිරීම උදෙසා දැනුමින් හා අත්දැකීම් සපිරි වෘත්තිකයින්ගේ ඵලදායි සේවයක් ලබා ගැනීම වෙනුවෙන් ව්‍යාපෘති කාර්ය මණ්ඩල තනතුරු හා වැටුප් සංශෝධනය කර **2016.03.24 දිනැතිව කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2016 නිකුත් කරන ලදි. ඒ අනුව 2018 වසර තුළදී** ද මෙම කටයුතු කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා අදාල සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබන රේඛීය අමාත්‍යාංශ/පළාත් සභා, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව හා ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉහළ සහයෝගයක් ලබා දෙන ලදී.

වගුව - 2.3 ව්‍යාපෘති කාර්ය මණ්ඩල අනුමත කිරීම.

| අනු අංකය | ව්‍යාපෘතිය | 2018 වර්ෂයට අනුමත තනතුරු සංඛ්‍යාව | අනුමත මුළු තනතුරු සංඛ්‍යාව |
|---|---|---|---|
| | <u>මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය</u> | | |
| 01. | World Bank Funded Eco-System Conservation & Management Project. | | 32 |
| 02. | Construction of Solid Waste Disposal Facilities Project. | 01 | 20 |
| 03. | පිළිසරු ව්‍යාපෘතිය. | 01 | 38 |
| 04. | ශ්‍රී ලංකා ප්‍රජා වන කළමනාකරණ වැඩසටහන | | 03 |
| 05. | 1. ශ්‍රී ලංකාවේ මහවැලි ගංගා ද්‍රෝණිය ආශ්‍රිත ජනපදවල කෘෂි පාරිසරික කලාප සංරක්ෂණය සහ දේශගුණික විපර්යාසවලට ජනයා අනුගත කිරීමේ ව්‍යාපෘතිය.<br>2. මානව පෝෂණය හා යහපැවැත්ම වැඩිදියුණු කිරීම සඳහා ජෛව විවිධත්වය හා තිරසාර භාවිතය අනුප්‍රවාහලත කිරීමේ ව්‍යාපෘතිය. | | 06<br>09 |
| 06. | ශ්‍රී ලංකාව තුළ පරිසරයට අහිතකර ද්‍රව්‍ය හා රසායනික කළමනාකරණය කිරීමේ වැඩසටහන. | | 10 |
| 07. | Enhancing Biodiversity Conservation & Sustenance of Ecosystem Services in Environmentally Sensitive Areas Project. | | 09 |
| 08. | දොම්පේ සනීපාරක්ෂක කසල බිම් ව්‍යාපෘතිය. | | 18 |
| 09. | ශ්‍රී ලංකාවේ තෙවන ජාතික දේශගුණ විපර්යාස සන්නිවේදන වාර්තාව සකස් කිරීමේ ව්‍යාපෘතිය. | | 07 |
| 10. | උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය. | 01 | 310 |
| 11. | ශ්‍රී ලංකාවේ මහවැලි ගංගා ද්‍රෝණිය ආශ්‍රිත ගොවි ජනපදවල කෘෂිකාර්මික ප්‍රජාව දේශගුණ විපර්යාසවල අහිතකර බලපෑම්වල අනුහුරු කරවීමේ ව්‍යාපෘතිය. | | 10 |
| 12. | ශ්‍රී ලංකාවේ ආගන්තුක ආක්‍රමණකාරී ජීවීන් ඇතුළු වීම හා පැතිරීම පාලනය සඳහාවන ධාරිතා වර්ධන ව්‍යාපෘතිය. | | 09 |
| 13. | Dam Safety & Water Resources Planning Project. | | 366 |
| 14. | Mahaweli Water Security Investment Programme Tranche 2 | | 185 |
| 15. | මාදුරු ඔය දකුණු ඉවුර සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය. | | 11 |
| 16. | ශ්‍රී ලංකාවේ මැණික් නිධි ගවේෂණය හා තක්සේරුව | | 22 |

| | | | |
|---|---|---|---|
| | ව්‍යාපෘතිය. | | |
| 17. | ඒකාබද්ධ ජල කළමනාකරණ ප්‍රවේශයක් තුළින් ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ දේශගුණික විපර්යාසවලට ඉඩම් හිමි ගොවීන්ගේ මුහුණ දීමේ ශක්තිය වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය. | | 29 |
| 18. | මොරගහකන්ද කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය. | 01 | 535 |
| | ආරක්ෂක අමාත්‍යාංශය | | |
| 01. | අකුරේගොඩ ආරක්ෂක සේවා මූලස්ථාන සංකීර්ණ ව්‍යාපෘතිය. | 01 | 2058 |
| | මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය | | |
| 01. | ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය ප්‍රධාන සැලැස්ම. | 01 | 17 |
| 02. | කොළඹ ජාත්‍යන්තර මූල්‍ය නගර ව්‍යාපෘතිය. | 06 | 34 |
| 03. | සැහැල්ලු දුම්රිය හුවමාරු ව්‍යාපෘතිය. | 03 | 109 |
| 04. | තාක්ෂණික නගර සංවර්ධන ව්‍යාපෘතිය. | 07 | 38 |
| 05. | සෙත්සිරිපාය පරිශ්‍රයේ බහුමහල් කාර්යාල සංකීර්ණය (සෙත්සිරිපාය අදියර III) | 40 | 40 |
| | පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | | |
| 01. | ප්‍රවාහන සම්බන්ධතා සහ වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය. | 24 | 24 |
| 02. | Local Government Support Project. | 06 | 06 |
| | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | | |
| 01. | Improvement of Basic Social Services Targeting Emerging. | | 12 |
| 02. | ඩෙංගු එන්නත් සායනිකව අත්හදා බැලීම සඳහා වූ පවුල් අධ්‍යයනය ව්‍යාපෘතිය. | 22 | 22 |
| 03. | Second Health Sector Development Project. | | 17 |
| 04. | Global Fund to Fight Aids, Tuberculosis & Malaria. | | |
| 05. | ගාල්ල මහමෝදර මාතෘ රෝහල ඉදිකිරීමේ ව්‍යාපෘතිය | | 08 |
| 06. | Health System Enhancement Project. | 42 | 41 |
| 07. | Health & Medical Service Improvement Project. | 15 | 19 |
| 08. | Primary Health Care Systems Strengthen Project. | 12 | 12 |
| 09. | Medical Supplies Management Information System. | 20 | 20 |
| 10. | ඩෙංගු මර්දනය සඳහා වූ වොල්බැචියා ව්‍යාපෘතිය. | 48 | 48 |
| | නගර සැළසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය | | |
| 01. | Task Force on Resettlement of Protracted IDPs in the Northern Province. | 51 | 51 |
| 02. | Science and Technology Human Resources Development Program. | 42 | 42 |
| 03. | යාපනය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ පර්යේෂණ සහ | 01 | 09 |

| | | | |
|---|---|---|---|
| | පුහුණු සංකීර්ණයක් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය. | | |
| 04. | Wayamba University Township Project. | 17 | 17 |
| 05. | World Bank Funds Accelerating Higher Education Expansion and Development Project. | | 33 |
| 06. | Development of the Faculty of Health Care Sciences, Eastern University of Sri Lanka. | | 15 |
| 07. | Township Development Program of the University of Sri Jayawardhanapura | | 08 |
| 08. | Knowledge Society Project. | | 03 |
| 09. | Institute of Technology, University of Moratuwa. | | 18 |
| 10. | South Eastern University Development Project. | | 08 |
| 11. | Pipe Borne Server Coverage to Rathmalana Moratuwa & Ja – Ela / Ekala areas. | 20 | 20 |
| 12. | Laggala & Wilgamuwa Water Supply Project. | Laggala 11<br>Wilgamuwa 11 | Laggala 11<br>Wilgamuwa 11 |
| 13. | Colombo District Water Supply Project. | 39 | 85 |
| 14. | China Sri Lanka Research Government Project. | 03 | 03 |
| 15. | Water Supply & Sanitation Improvement Project. | 60 | 60 |
| වාරිමාර්ග, ජලසම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය | | | |
| 01. | කළුගල් ඔය ජලාශ ව්‍යාපෘතිය. | 04 | 28 |
| 02. | පහළ මල්වතු ඔය ජලාශ ව්‍යාපෘතිය. | 19 | 19 |
| 03. | ඵලදායීතා ප්‍රවර්ධන හා වාරිමාර්ග පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය. | 49 | 49 |
| 04. | මුන්දෙණි ආරු ගංගාද්‍රෝණි සංවර්ධන ව්‍යාපෘතිය. | 12 | 30 |
| 05. | කින්නියා කන්තලේ ව්‍යාපෘතිය. | 23 | 38 |
| මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය | | | |
| 01. | Second Inergranted Road Investment Program – Eastern Province. | 26 | 26 |
| 02. | Second Inergranted Road Investment Program – Western Province. | 21 | 21 |
| 03. | Second Inergranted Road Investment Program – Uva Province. | 24 | 24 |
| 04. | Second Inergranted Road Investment Program – Northern Province. | 33 | 33 |
| 05. | Exim Bank of China funded widening & improvement of 64.31km roads in Central & Uva Province. | 33 | 49 |
| 06. | New Kelani Bridge – Athurugiriya Elevated Highway Project. | 11 | 27 |

| | | | |
|---|---|---|---|
| අධ්‍යාපන අමාත්‍යාංශය | | | |
| 01. | ළඟම පාසල හොඳම පාසල ව්‍යාපෘතිය. | 09 | 256 |
| 02. | තාක්ෂණ අධ්‍යාපන සංවර්ධන ව්‍යාපෘතිය. | 18 | 18 |
| වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | | | |
| 01. | Smallholder Tea & Rubber Revitalization Project. | 00 | 131 |
| වරාය හා නාවික කටයුතු සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය | | | |
| 01. | Rehabilitation of Kankasanthurai Harbour | 10 | 10 |
| 02. | කලපු හා අභ්‍යන්තර ජලාශ ආශ්‍රිත ජලජ පරිසර සංරක්ෂණය හා ජලජීවී වගාව ඉහළ නැංවීමේ ව්‍යාපෘති | 27 | 27 |
| 03. | Northern Province Substainable Fisheries Development Project | 07 | 12 |
| **ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය** | | | |
| 01. | මාතර - බෙලිඅත්ත දුම්රිය මාර්ගය ඉදි කිරීමේ ව්‍යාපෘතිය | | 53 |
| 02. | කොළඹ නගරාශ්‍රිත දුම්රිය ව්‍යාපෘතිය | 51 | 77 |
| 03. | කුරුණෑගල - දඹුල්ල හරහා හබරණ දක්වා නව දුම්රිය මාර්ග ව්‍යාපෘතිය | | 31 |
| 04. | මැදිරි 200ක මහා පරිමාණ අළුත්වැඩියාවන් බාහිර පාර්ශවයන් මගින් ඉටු කිරීම සඳහා වන ප්‍රසම්පාදන ව්‍යාපෘතිය (දුම්රිය දෙපාර්තමේන්තුවේ දැනට සේවයේ යෙදී සිටින නිලධාරීන්ගෙන් වැඩ බැලීමේ පදනම මත ඉටුකර ගැනීම අනුමත කර ඇත.) | | |
| 05. | බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | | 45 |
| **අනුමත මුලු තනතුරු ගණන** | | **883** | **5,552** |

# 03. කාර්ය මණ්ඩල සමාලෝචනය - 2018

## 3.1 හැදින්වීම.

රජයේ කාලීන අවශ්‍යතා ඉටුකර ගැනීමට හැකිවන පරිදි රාජ්‍ය අංශයේ කාර්ය මණ්ඩලය දිනෙන් දින වර්ධනය වෙමින් පවතී. සේවාවක් ස්ථාපිත කරන අවස්ථාවේදී හෝ පසුකාලීනව සේවක සංඛ්‍යාවෙහි පවතින ක්‍රමානුකූලව හඳුනාගත් ඌනතාවයන් ඉවත්වන ආකාරයටත්, ආයතනික කාර්යභාරයන්, ව්‍යුහයන් සහ ආයතනයන්ට පෞද්ගලික වන සේ සලකනු ලබන කාර්යය අවශ්‍යතා මෙම කාර්ය මණ්ඩලයෙන් සපුරා ගැනීම තහවුරු වන ආකාරයටත්, රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යාව ප්‍රතිව්‍යුහගත කිරීමේ අරමුණ උදෙසා 2017.01.11 දිනැති අංක 01/2017 දරණ කළමනාකරණ සේවා චක්‍රලේඛය නිකුත් කර ඇත.

රාජ්‍ය ආයතනයන්හි සේවා සැපයීමේ ගුණාත්මකබව පුළුල් කිරීමේ අරමුණ ඇතිව 2017දී මෙන්ම 2018 වර්ෂයේදී සිදුකළ  කාර්ය මණ්ඩල සමාලෝචනය තුළින් ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවයේ මානව සම්පතෙහි වර්තමාන තත්ත්වය ද නිතැතින්ම අධ්‍යයනය කෙරිණි. කාර්ය මණ්ඩල සමාලෝචනයේ ප්‍රධාන අරමුණ වූයේ මිනිස් බලය පුරෝකථනය සහ විද්‍යාත්මක ක්‍රමවේදයකට අනුකූලව බඳවාගැනීම් සිදු කිරීමට සමගාමීව වර්තමානයේ පවතින කාර්ය මණ්ඩලයේ සේවා සැපයීම සිදුවනුයේ කාර්යක්ෂමතාවය, සේවක අභිප්‍රේරණය සහ ඵලදායීතාවය වැනි  පූර්වයෙන් හඳුනාගත් නිර්ණායකයන්ට අනුකූලව ද යන්න පිළිබඳව වැඩි අවධානයක් යොමු කර අධ්‍යයනයක් සිදු කිරීමයි.

විශේෂයෙන්ම කාර්ය මණඩල සමාලෝචනයේ ප්‍රධාන අරමුණු පහත පරිදි වේ.

- ඉදිරි වසර 05ක කාල සීමාවක් සඳහා විද්‍යාත්මක පදනමකින් මිනිස් බල අවශ්‍යතාවය තක්සේරු කිරීම.
- ආයතනය සඳහා ගැසට් කරන ලද කාර්යයන් හා සිදු කරන කාර්යය අතර කිසියම් විචල්‍යතාවයක් පවතී ද යන්න පරීක්ෂා කිරීම.
- එසේ විචල්‍යතාවයක් පවතී නම් එම කාර්යයන් ද්විත්වකරණයක් ලෙස හඳුනා ගැනීම.
- උසස් කිරීමේ බාධක වළක්වමින් සහ එකම සේවය තුළ උසස්වීම් අතර පරතරය නිර්මාණය වීම වලක්වන ආකාරයෙන් ඉදිරියේ දී බඳවා ගැනීම් සැලසුම් කිරීම.
- සාමාජිකයන්හට ස්වකීය වෘත්තිමය නීත්‍යානුකූල අපේක්ෂාවන් සමග කාර්යමය අවශ්‍යතාවයන්ට අනුකූල කිරීම උදෙසා කාර්ය මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීම.
- සේවයන්හි ඵලදායිතාවය ඉහළ දැමීම.

ඒ අනුව, සියලුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා සහ පළාත් පාලන ආයතන හා දෙපාර්තමේන්තු බහුතරයක කාර්ය මණ්ඩල සමාලෝචනය සිදුකර වාර්තා පිළියෙල කර ඇති අතර, හඳුනාගත් ප්‍රශස්ත කාර්ය මණ්ඩලය ඒ පිළිබඳව වගකීම දරන පාර්ශව වන කළමනාකරණ සේවා

දෙපාර්තමේන්තුව, ජාතික අයවැය දෙපාර්තමේන්තුව, ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව සහ මුදල් කොමිෂන් සභාව යන ආයතන එක්ව තීරණය කරනු ලැබ ඇත.

ශ්‍රී ලංකාවේ සමස්ත ජනගහනයට සාපේක්ෂව රාජ්‍ය අංශයේ හඳුනාගත් රැකියා කාණ්ඩ කිහිපයක අනුමත කාර්ය මණ්ඩල අනුපාතයන් 2018.12.31 දිනට පහත පරිදි වේ.

**වගුව 3.1 : සමස්ත ජනගහනයට සාපේක්ෂව රාජ්‍ය අංශයේ හඳුනාගත් රැකියා කාණ්ඩ කිහිපයක අනුමත කාර්ය මණ්ඩල අනුපාතයන් - 2018**

| මුළු ජනගහනය (ආසන්නව) | ආයතනය/ රැකියා කාණ්ඩය | කාර්ය මණ්ඩලය | ජනගහනය : කාර්ය මණ්ඩලය |
|---|---|---|---|
| 21,000,000 | ත්‍රිවිධ හමුදා කාර්යමණ්ඩලය | 292,401 | 71 : 1 |
| | ගුරුවරුන් | 237,963 | 88 : 1 |
| | ශ්‍රී ලංකා පොලිසිය | 96,185 | 218 : 1 |
| | විධායක ශ්‍රේණියේ නිලධාරීන් | 52,541 | 399 : 1 |
| | ශ්‍රී ලංකා වෛද්‍ය සේවයේ නිලධාරීන් | 26,223 | 800 : 1 |
| | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ නිලධාරීන් | 1,488 | 14,112 : 1 |

මූලාශ්‍රය - කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

## 3.2. රාජ්‍ය සේවක කාර්ය මණ්ඩලය පිළිබඳ කාර්තුමය තොරතුරු

2017 අගෝස්තු 15 පවත්වනු ලැබූ අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ගත් අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, කාර්ය මණ්ඩල බඳවා ගැනීම්, සේවක ඉල්ලා අස්වීම්, තනතුරු අත්හැරයාම්, සේවයෙන් පහ කිරීම්. විශ්‍රාමයාම් සහ මියයාම් වැනි හේතූන් නිසා රාජ්‍ය අංශයේ කාර්ය මණ්ඩලයේ සිදුවන වෙනස්වීම් අනුව කාර්තුමය වශයෙන් යාවත්කාලීන කරමින් රාජ්‍ය අංශයේ කාර්ය මණ්ඩල දත්ත පද්ධතිය පවත්වාගෙන යාමේ වගකීම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත පවරනු ලැබ ඇත.

ඒ අනුව බඳවා ගැනීම්, ඉල්ලා අස්වීම්, තනතුරු අත්හැරයාම්, සේවයෙන් අස් කිරීම්. විශ්‍රාමයාම් සහ මියයාම් වැනි හේතූන් නිසා කාර්ය මණ්ඩල සංඛ්‍යාවෙහි සිදුවන වෙනස්වීම් ඇතුළත් කරමින් 2018.10.01 සිට 2018.12.31 දක්වා 2018 වර්ෂයේ 4 වන කාර්තුවට අදාළව යාවත්කාලීන කරන ලද කාර්ය මණ්ඩලය තොරතුරු අමාත්‍ය මණ්ඩලයේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කරනු ලැබ ඇත.

**වගුව 3.2 : රාජ්‍ය අංශයේ කාර්ය මණ්ඩල සම්බන්ධයෙන් 2018 වර්ෂයේ 3 වන කාර්තුව සහ 4වන කාර්තුවේ කාර්ය මණ්ඩල තොරතුරු.**

| | **3 වන කාර්තුව** | **4 වන කාර්තුව** |
|---|---|---|
| බඳවා ගැනීම් | 13,837 | 9,863 |
| උසස්වීම් | 17,875 | 12,801 |
| ද්විතියික පදනම මත සේවය කිරීම | 6,581 | 6,687 |
| විශ්‍රාම ගැන්වීම් | 5,097 | 5,484 |
| ඉල්ලා අස්වීම් | 1,093 | 1,150 |
| සේවය අතහැර යාම | 1,706 | 991 |
| මියයෑම් | 298 | 251 |
| සේවයෙන් පහ කිරීම් | 881 | 940 |

මූලාශ්‍රය - කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

# 04. වැටුප් හා පාරිශ්‍රමික කළමනාකරණය

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති කාර්ය භාරය අතර රාජ්‍ය අංශයේ වැටුප් හා ප්‍රසාද දීමනා, දිරිකාරක යෝජනා ක්‍රම හා වෙනත් පාරිශ්‍රමික කළමනාකරණය ද ප්‍රමුඛ වේ. මෙම කාර්යයේ දී ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව හා ජාතික අයවැය දෙපාර්තමේන්තුව යන ආයතනවල නිරීක්ෂණ සහ නිර්දේශ ද සැලකිල්ලට ගෙන අදාළ තීරණ ලබා දීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව කටයුතු කරන ලදී. එසේම වැටුප් හා පාරිශ්‍රමික පිළිබඳ ප්‍රායෝගික ගැටලු පැන නඟින අවස්ථාවල දී අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් කරනු ලබන විමසීම් සඳහා අවශ්‍ය උපදෙස් හා පැහැදිලි කිරීම් ලබා දීම ද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි. ඒ අනුව **2018 වසර තුළ දී පහත සඳහන් චක්‍රලේඛ** නිකුත් කරන ලදී.

වගුව **4.1 : 2018 වර්ෂයේ දී නිකුත් කරන ලද කළමනාකරණ සේවා චක්‍රලේඛ .**

| | | |
|---|---|---|
| 01. | 2018.04.11 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 (ii) | රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල සේවක වැටුප් සංශෝධනය කිරීම - 2016 |
| 02. | 2018.06.07 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 (iii) | රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල සේවක වැටුප් සංශෝධනය කිරීම - 2016 |
| 03. | 2018.07.18 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 03/2018 | රාජ්‍ය අංශයේ ආයතනවලට කාර්ය මණ්ඩල බඳවා ගැනීම් හා වැටුප් හා දීමනා ගෙවීම. |
| 04. | 2018.11.21 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 04/2018 | රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල සේවයේ නියුතු නිලධාරිනියන්ට මදසරුභාවය සඳහා ප්‍රතිකාර ලබා ගැනීමට වැටුප් රහිත නිවාඩු ලබා දීම. |

රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යාව සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන සෑම පුද්ගලයෙකුටම සහ පොදු මහජනතාවගේ දැනගැනීමේ අරමුණු ඇතිව **2018 වර්ෂයේ දී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශන ගණනාවක් එළි දක්වා ඇත. එම ප්‍රකාශයන්** www. Treasury.gov.lk/web/ department–management–services/links **සම්බන්ධතාව ඔස්සේ බාගත කර ගත හැක.**

# 05. පර්යේෂණ, නිරීක්ෂණ ඉදිරිපත් කිරීම හා කමිටු නියෝජනය

## 5.1 පර්යේෂණ කටයුතු.

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති කාර්ය භාරයන් අතරින් රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යාවන්ට අදාළ වූ ප්‍රතිසංස්කරණ හඳුන්වාදීම, රාජ්‍ය ආයතන ප්‍රතිව්‍යුහගත කිරීම හා ප්‍රශස්ත කාර්ය මණ්ඩලයක් පවත්වා ගැනීම, රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යා පිළිබඳ සම්මත මිනුම් හා ප්‍රමිතීන් ගොඩනගා ගැනීම, වැටුප් හා දීමනා සහ අනෙකුත් පාරිශ්‍රමික පිළිබඳ අධ්‍යයනය කර නිරීක්ෂණ හා නිර්දේශ ඉදිරිපත් කිරීම හා තීරණ ලබාදීම, රටෙහි සංවර්ධන අවශ්‍යතාවයන්ට ගැළපෙන පරිදි රාජ්‍ය අංශයේ විවිධ සේවාවන් සඳහා සේවා ව්‍යවස්ථා හා සේවා කොන්දේසි සමාලෝචනය කර අවශ්‍ය සංශෝධන සිදු කිරීම සහ ඊට අදාළ නිරීක්ෂණ හා නිර්දේශ ඉදිරිපත් කිරීම වැනි අවස්ථාවල දී දෙපාර්තමේන්තුවට අනෙකුත් ආයතන සමඟ සමීපව කටයුතු කිරීමට සිදු වේ.

එකී කාර්යයන් ඉහළ ප්‍රමිතියකින් හා කාර්යක්ෂමව සිදු කිරීම සඳහා මෙම දෙපාර්තමේන්තුව තුළ පර්යේෂණ අංශයක් ස්ථාපනය කර ඇත. දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ඵලදායීව ඉටු කිරීමේ දී අවශ්‍ය වන ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහා තොරතුරු රැස් කිරීම, එම තොරතුරු විශ්ලේෂණය කර නිරීක්ෂණ හා නිර්දේශ සහිත වාර්තා ඉදිරිපත් කිරීම පර්යේෂණ අංශය වෙත පැවරී ඇති ප්‍රධානතම කාර්යභාරය වේ. මෙහිදී අවශ්‍ය විමර්ශන/අධ්‍යයන සඳහා පර්යේෂණ අංශයේ නිලධාරීන් අදාළ ආයතන වෙත යොමු කර තොරතුරු රැස් කිරීම ද සිදු කෙරේ.

## 5.2 අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම.

රාජ්‍ය අංශයේ ආයතන කටයුතු, වැටුප් හා දීමනා තීරණය කිරීම ආදී මෙම දෙපාර්තමේන්තුවේ විෂය පථයට අයත් වන කරුණු සම්බන්ධයෙන් ඉදිරිපත් වන අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ ලබා දීම ද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරයකි. 2018 වසර තුළ දෙපාර්තමේන්තුව විසින් නිරීක්ෂණ ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල පත්‍රිකා සහ ඒවා අයත් වන විෂය ක්ෂේත්‍ර පිළිබඳ තොරතුරු 5.1 වගුව මගින් දක්වා ඇත.

**වගුව 5.1 : අමාත්‍ය මණ්ඩල සංදේශ නිරීක්ෂණ වර්ගීකරණය - 2018.**

| අනු අංකය | ක්ෂේත්‍රය/විෂයය | සංදේශ ගණන |
|---|---|---|
| 1. | පත් කිරීම්/ බඳවා ගැනීම් | 256 |
| 2. | සේවය දීර්ඝ කිරීම් | 93 |
| 3. | තනතුරු ඇති කිරීම් | 38 |
| 4. | පාරිශ්‍රමික | 10 |
| 5. | සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනීමේ පරිපාටි | 9 |
| 6. | විනය කටයුතු | 1 |
| 7. | කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම් | 31 |
| 8. | අනෙකුත් | 153 |
| **එකතුව** | | **591** |

මූලාශ්‍රය : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2018 වර්ෂය තුළ නිරීක්ෂණ ලබා දෙන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ අතරින් තනතුරු සඳහා පත් කිරීම, සේවය දීර්ඝ කිරීම සහ පාරිශ්‍රමික සම්බන්ධ කරුණු ප්‍රධාන තැනක් ගන්නා ලදී. අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ ලබා දීමට අමතරව නිතිපතා පැවැත්වෙන ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකමිටු රැස්වීම් සඳහා ද දෙපාර්තමේන්තුවේ සහභාගිත්වය ලබා දෙන ලදී.

2008 සිට 2018 වර්ෂය දක්වා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිරීක්ෂණ ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ සංඛ්‍යාව පිළිබඳ තොරතුරු 5.2 වගුව මගින් දක්වා ඇත.

**වගුව 5.2 : අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම.**

| වර්ෂය | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| නිරීක්ෂණ ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශ සංඛ්‍යාව | 750 | 1272 | 1598 | 1019 | 399 | 499 | 449 | 537 | 605 | 747 | 591 |

මූලාශ්‍රය : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

## 5.3 කමිටු නියෝජනය, සම්බන්ධීකරණ කටයුතු හා සන්නිවේදනය.

සංවර්ධන හා ආයතන කටයුතු සම්බන්ධ පහත සඳහන් සමුළු හා සාකච්ඡා සඳහා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් මුදල් අමාත්‍යාංශයේ හා භාණ්ඩාගාරයේ ලේකම් හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් නියෝජනය කරමින් ක්‍රියාකාරී ලෙස දායකත්වය සපයා ඇත.

- ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකමිටුව
- අමාත්‍ය මණ්ඩලය විසින් දෙපාර්තමේන්තුවේ නියෝජිතයන් ඇතුළත්ව පත් කර ඇති නිලධාරි කමිටු
- රාජ්‍ය ගිණුම් කාරක සභාව (COPA)
- පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (COPE)
- දිස්ත්‍රික් ලේකම්/දිසාපති සමුළු
- පළාත් ප්‍රධාන ලේකම් සමුළු
- ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභා සාකච්ඡා
- ව්‍යාපෘති ප්‍රගති සමාලෝචන සහ නියාමන (Steering) කමිටු
- ව්‍යවස්ථාපිත ආයතනයන්හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහ කළමනාකරණ හා විගණන කමිටු රැස්වීම්
- ප්‍රසම්පාදන හා තාක්ෂණ ඇගයීම් කමිටු

තවද, විවිධ ආයතනයන්හි ඉල්ලීම් පරිදි සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සාමාජිකයන් වශයෙන් ද මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහභාගි වී ඇත. එසේම, රාජ්‍ය ආයතනවල කාර්ය මණ්ඩල ගැටලු සම්බන්ධයෙන් අදාළ නිලධාරීන් සමග නිරන්තර සාකච්ඡා පවත්වමින් ඵලදායී සන්නිවේදනයක් පවත්වාගෙන යාමට මෙම දෙපාර්තමේන්තුව නිරන්තරයෙන් කටයුතු කරනු ලැබ ඇත.

# 06. ආයතන අංශය.

## 6.1 කාර්ය මණ්ඩල තොරතුරු - 2018.

වගුව - **6.1** කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ **2018.12.31** දිනට කාර්ය මණ්ඩල තොරතුරු.

| අනු අංකය | තනතුර | අනුමත | තත්‍ය | පුරප්පාඩු/අතිරික්ත |
|---|---|---|---|---|
| 1. | අධ්‍යක්ෂ ජනරාල් | 1 | 1 | 0 |
| 2. | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | 2 | 2 | 0 |
| 3. | අධ්‍යක්ෂ | 8 | 7 | 1 |
| 4. | මානව සම්පත් කළමනාකරණ විශේෂඥ | 1 | 0 | 1 |
| 5. | වැඩ අධ්‍යයන විශේෂඥ | 1 | 0 | 1 |
| 6. | සංඛ්‍යා ලේඛනඥ | 1 | 0 | 1 |
| 7. | සහකාර / නියෝජ්‍ය අධ්‍යක්ෂ | 8 | 6 | 2 |
| 8. | ගණකාධිකාරී | 1 | 1 | 0 |
| 9. | සහකාර අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) | 1 | 1 | 0 |
| 10. | පරිපාලන නිලධාරී | 1 | 1 | 0 |
| 11. | භාෂා පරිවර්තක | 1 | 1 | 0 |
| 12. | පර්යේෂණ සහකාර | 1 | 1 | 0 |
| 13. | සංවර්ධන නිලධාරී | 6 | 6 | 0 |
| 14. | තොරතුරු තාක්ෂණ සහකාර | 1 | 1 | 0 |
| 15. | රාජ්‍ය කළමනාකරණ සහකාර | 33 | 34 | -1 |
| 16. | රියදුරු | 10 | 10 | 0 |
| 17. | කාර්යාල කාර්ය සහායක | 8 | 8 | 0 |
| | **එකතුව** | **85** | **80** | **6/1** |

මූලාශ්‍රය : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති කාර්ය භාරය කාර්යක්ෂමව හා ඵලදායීව ඉටු කිරීමේ දී දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ ශ්‍රකියා තෘප්තිය ඉහළ මට්ටමක පවත්වාගෙන යාම ඉතා වැදගත් වේ. දෙපාර්තමේන්තුවේ භෞතික පරිසරය, ශ්‍රකියා තෘප්තිය වර්ධනය කරලීමට සමත් මිත්‍රශීලී කාර්යාල පරිසරයක් ලෙස සකස් කර දීමටත්, කණ්ඩායමක් ලෙස කටයුතු කිරීමේ දී කාර්ය මණ්ඩලයට අවශ්‍ය සහයෝගය ලබා දීමටත් ආයතන අංශය කටයුතු කරන ලදී.

2018 වර්ෂයේ දී දෙපාර්තමේන්තුව සතුව තිබූ මානව හා භෞතික සම්පත් උපරිම කාර්යක්ෂමතාවයෙන් හා ඵලදායීතාවයෙන් යුතුව භාවිත කිරීම තුළින් දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය බාධාවකින් තොරව පවත්වා ගැනීමට සමත් විය. 2018.12.31 දිනට දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්ය මණ්ඩල තොරතුරු 6.1 වගුව මගින් දැක්වේ.

## 6.2 වයස් කාණ්ඩය අනුව කාර්යමණ්ඩලය වර්ගීකරණය.

**වගුව - 6.2 වයස් කාණ්ඩය අනුව කාර්ය මණ්ඩලය වර්ගීකරණය - 2018.**

| වයස් කාණ්ඩය | ස්ත්‍රී | පුරුෂ |
|---|---|---|
| 25 > | 01 | 00 |
| 26-35 | 08 | 06 |
| 36-45 | 18 | 19 |
| 46-50 | 07 | 09 |
| 51-55 | 02 | 10 |
| 55 < | 00 | 00 |
| එකතුව | **36** | **44** |

මූලාශ්‍රය : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

## 6.3 පුහුණු වැඩසටහන්.

### 6.3.1 දේශීය පුහුණු වැඩසටහන්.

දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ කාර්ය සාධනය ඉහළ නැංවීම සඳහා පුහුණු වැඩසටහන් සැලසුම්ගතව පැවැත්වීම අරමුණු කොටගෙන දෙපාර්තමේන්තුව සඳහා වාර්ෂික පුහුණු සැලැස්මක් සකස් කරන ලදී. දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ පුහුණු අවශ්‍යතා මෙන්ම දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති කාර්ය භාරයන් ද මෙම වාර්ෂික පුහුණු සැලැස්ම සකස් කිරීමේ දී සැලකිල්ලට ගනු ලැබීය. ඒ අනුව 2018 වර්ෂය තුළ පවත්වන ලද දේශීය පුහුණු වැඩසටහන් 6.3 වගුව මගින් දක්වා ඇත.

වගුව - 6.3 දේශීය පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වීම - 2018.

| අනු අංකය | ක්ෂේත්‍රය | පුහුණු ආයතනය | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | Diploma in Public Procurement and Contract Administration (DIPPCA) 3rd Intake. ප්‍රසම්පාදන පාඨමාලාව. | මිලෝදා ආයතනය | 02 |
| 2 | ඉංග්‍රීසි භාෂා සහතික පත්‍ර පාඨමාලාව - 2018. | මිලෝදා ආයතනය | 06 |
| 3 | ඉංග්‍රීසි භාෂා ඩිප්ලෝමා පාඨමාලාව - 2018. | මිලෝදා ආයතනය | 04 |
| 4 | දෙමළ භාෂා සහතික පත්‍ර පාඨමාලාව - 2018. | මිලෝදා ආයතනය | 02 |
| 5 | ආර්ථික විද්‍යා අංශයේ පශ්චාත් උපාධි පාඨමාලාව. | කොළඹ විශ්වවිද්‍යාලය | 01 |
| 6 | ආයතන සංග්‍රහයේ විධිවිධාන පිළිබඳ රාජ්‍ය නිලධාරීන් දැනුම්වත් කිරීමේ පුහුණු වැඩසටහන (මාණ්ඩලික). | රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය | 01 |
| 7 | පොත් බැඳුම්කරණ පාඨමාලාව. | ජාතික ලේඛණාරක්ෂක දෙපාර්තමේන්තුව | 01 |
| 8 | PHP-MySQL Web Development Programme. | ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය | 01 |
| 9 | Essence of public Procurement Management. | මිලෝදා ආයතනය | 01 |
| 10 | Speechcraet Training with Toastmasters International for Special Grade Officers of all Island Services. | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 01 |
| 11 | Commputerized Government Payroll System. | මිලෝදා ආයතනය | 03 |
| 12 | රාජ්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව. | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 01 |
| 13 | ආයතන සංග්‍රහයේ විධිවිධාන පිළිබඳ රාජ්‍ය නිලධාරීන් දැනුම්වත් කිරීමේ පුහුණු වැඩසටහන. | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය | 03 |
| 14 | Formal Letter Writing Skills. | මිලෝදා ආයතනය | 01 |
| 15 | Disciplinary Procedures in the Public Sector. | මිලෝදා ආයතනය | 04 |

### 6.3.2 විදේශීය පුහුණු වැඩසටහන්.

දෙපාර්තමේන්තු නිලධාරීන්ට විදේශීය පුහුණු අවස්ථා ලබා දෙමින් ඔවුන්ගේ අත්දැකීම් හා විෂය දැනුම වර්ධනය කිරීමට 2018 වර්ෂය තුළ දී කටයුතු කරන ලදී. **(වගුව 6.4)**

වගුව **6.4** : **විදේශීය පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වීම - 2018.**

| අනු අංකය | නම | තනතුර | ලද පුහුණුව | රට | කාලය |
|---|---|---|---|---|---|
| 1. | ඒ.යූ.කේ. දොඩන්වල මිය | අධ්‍යක්ෂ | PIM International Management Programme | ඉන්දුනීසියාව | 2018.01.28 2018.02.04 |
| 2. | ඩබ්ලිව්.ඩී. සේපාලිකා මිය | සහකාර අධ්‍යක්ෂ | Workshop on Impelenting Sustainable E-Government Solutions | සිංගප්පූරුව | 2018.02.25 2018.03.04 |
| 3. | එස්.එල්.එම්. වර්ණසූරිය මෙනවිය | සහකාර අධ්‍යක්ෂ | | | |
| 4. | බී.එම්.ඩී.එන්. බාලසූරිය මිය | අධ්‍යක්ෂ | PIM International Programme in Management | නවසීලන්තය | 2018.03.25 2018.04.01 |
| 5. | පී.එල්.ජේ. ගුණරත්න මිය | අධ්‍යක්ෂ | | | |
| 6. | කේ.ඩී.අයි.එස්.කේ. සිරිවර්ධන මිය | ගණකාධිකාරි | International Programme on Stratergic Management | ඉන්දුනීසියාව | 2018.04.21 2018.04.30 |
| 7. | එම්. ගෝපාලරත්නම් මහතා | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | | | |
| 8. | ආර්.එම්.කේ. සංජීවනී මෙනවිය | සහකාර අධ්‍යක්ෂ | රාජ්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධිය | ජපානය | 2018.08.12 2018.08.31 |
| 9. | බී.එම්.ඩී.එන්. බාලසූරිය මිය | අධ්‍යක්ෂ | Second Country Study visit – Capacity Building Trainig Programme for Class I Officers of the Sri Lanka Administratine Service | මැලේසියාව | 2018.09.17 2018.09.23 |
| 10. | එස්.එල්.එම්. වර්ණසූරිය මෙනවිය | සහකාර අධ්‍යක්ෂ | 2018 Seminaar on Aid for Trade for Senior Officials of Developing Countries | චීනය | 2018.10.16 2018.10.29 |

| අනු අංකය | නම | තනතුර | ලද පුහුණුව | රට | කාලය |
|---|---|---|---|---|---|
| 11. | තමරා ඩී පෙරේරා මිය | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | Public Administration and E - Government | චීනය | 2018.11.05 2018.11.27 |
| 12. | කේ.එම්.ඩී.එල්.ටී. පීරිස් මිය | සහකාර අධ්‍යක්ෂ | | | |
| 13. | කේ.ඩී.අයි.එස්.කේ. සිරිවර්ධන මිය | ගණකාධිකාරි | Seminar on Management of China's Assistance Projects and Related Financial Services for Developing countries | චීනය | 2018.11.08 2018.12.01 |
| 14. | එස්.එල්.එම්. වර්ණසූරිය මෙනවිය | සහකාර අධ්‍යක්ෂ | ADIB E-Learning course 2018 | ජපානය | 2018.11.12 2018.11.14 |
| 15. | එස්.එච්.ඩී. කළුතන්ත්‍රි මිය | අධ්‍යක්ෂ | PIM Internationam Management Programme | තායිලන්තය | 2018.11.25 2018.12.02 |

# 07. මූල්‍ය අංශය.

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් වැඩසටහන යටතේ 2018 වර්ෂය සඳහා මානව සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා 242 වැය ශීර්ෂයට වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය රු. 87,110,000 ක් වූ අතර සත්‍ය වියදම රු. 81,821,452 ක් විය. ඒ අනුව වෙන් කරන ලද ප්‍රතිපාදනවලින් සියයට අනූ තුනයි දශම නවයයි දෙකක් (93.92%) දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවයන් සපුරා ගනිමින් අරපිරිමැසුම්දායක ලෙස භාවිත කර ඇත. මූල්‍ය ප්‍රගතිය පහත 7.1 වගුව මගින් දැක්වේ.

**වගුව - 7.1 මූල්‍ය ප්‍රගතිය 2017 - 2018**

| වැය විස්තරය | | 2017 | | | 2018 | | |
|---|---|---|---|---|---|---|---|
| | | අනුමත ප්‍රතිපාදනය (අවුරා තබන ලද ප්‍රතිපාදන හැර) (රුපියල්) | මුළු වියදම (රුපියල්) | වියදම් ප්‍රතිශතය ( %) | අනුමත ප්‍රතිපාදනය (රුපියල්) | මුළු වියදම (රුපියල්) | වියදම් ප්‍රතිශතය (%) |
| **පුනරාවර්තන වියදම්** | | **72,363,300** | **66,207,221** | **91.49** | **80,535,000** | **78,885,383** | **97.95** |
| **පුද්ගල පඩිනඩි** | | **52,466,000** | **48,185,027** | **91.84** | **54,785,000** | **53,949,515** | **98.47** |
| 1001 | වැටුප් හා වේතන | 29,004,000 | 27,583,880 | 95.10 | 32,750,000 | 32,657,685 | 99.71 |
| 1002 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 1,432,000 | 1,093,832 | 76.38 | 1,750,000 | 1,607,966 | 91.88 |
| 1003 | වෙනත් දීමනා | 22,030,000 | 19,507,297 | 88.55 | 20,285,000 | 19,683,864 | 97.03 |
| **ගමන් වියදම්** | | **341,000** | **155,354** | **45.55** | | | |
| 1101 | දේශීය | 130,000 | 124,616 | 95.86 | 250,000 | 164,258 | 65.70 |
| 1102 | විදේශීය | 211,000 | 30,737 | 14.57 | 2,052,000 | 2,050,568 | 99.93 |
| **සැපයීම්** | | **6,132,000** | **5,464,132** | **89.10** | | | |
| 1201 | ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 2,600,000 | 2,516,124 | 96.77 | 3,050,000 | 3,004,984 | 98.52 |
| 1202 | ඉන්ධන | 2,932,000 | 2,506,669 | 85.49 | 3,235,000 | 3,185,626 | 98.47 |
| 1203 | ආහාරපාන හා නිල ඇඳුම් | 100,000 | 64,000 | 64.00 | 65,000 | 64,000 | 98.46 |
| 1205 | වෙනත් | 500,000 | 377,339 | 75.47 | 350,000 | 235,714 | 67.34 |
| **නඩත්තු වියදම්** | | **1,502,000** | **1,361,130** | **90.62** | | | |
| 1301 | වාහන | 1,132,000 | 1,059,810 | 93.62 | 1,450,000 | 1,421,085 | 98 |
| 1302 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 370,000 | 301,320 | 81.44 | 300,000 | 290,624 | 96.87 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **සේවා** | | **10,622,300** | **9,859,299** | **92.81** | | | |
| 1401 | ප්‍රවාහන | 2,050,000 | 2,044,307 | 99.72 | 2,935,000 | 2,914,366 | 99.29 |
| 1402 | තැපැල් හා සන්නිවේදන | 1,886,000 | 1,645,024 | 87.22 | 2,000,000 | 1,888,391 | 94.41 |
| 1405 | වෙනත් | - | - | - | | | |
| 1408 | **මෙහෙයුම් කල්බදු** | 5,643,300 | 5,418,012 | 96.01 | **7,793,000** | **7,540,728** | **96.76** |
| 1409 | වෙනත් | 1,043,000 | 751,957 | 72.10 | 970,000 | 905,535 | 93.35 |
| **මාරු කිරීම්** | | **1,200,000** | **1,167,278** | **97.27** | | | |
| 1506 | රජයේ සේවකයින් සඳහා දේපළ ණය පොළී | 1,200,000 | 1,167,278 | 97.27 | 1,300,000 | 1,269,988 | 97.69 |
| **වෙනත්** | | **100,000** | **15,000** | **15.00** | | | |
| 1703 | රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම | 100,000 | 15,000 | 15.00 | - | - | - |
| **මූලධන වියදම්** | | **3,834,000** | **3,676,461** | **95.89** | | | |
| **මූලධන වත්කම්වල පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම** | | **920,000** | **919,665** | **99.96** | | | |
| 2002 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | - | - | - | 200,000 | 77,110 | 38.55 |
| 2003 | වාහන | 920,000 | 919,665 | 99.96 | 1,000,000 | 496,910 | 49.69 |
| **මූලධන වත්කම් අත්පත් කර ගැනීම** | | **1,500,000** | **1,348,142** | **89.87** | | | |
| 2102 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 1,500,000 | 1,348,142 | 89.88 | - | - | - |
| 2106 | මෘදුකාංග සංවර්ධනය | - | - | - | 2,000,000 | - | - |
| **හැකියා වර්ධනය** | | **1,414,000** | **1,408,655** | **99.62** | **-** | **-** | **-** |
| 2401 | කාර්ය මණ්ඩල පුහුණු කිරීම් | 1,414,000 | 1,408,655 | 99.62 | 2,375,000 | 2,322,430 | 97.78 |
| **මුළු එකතුව** | | **76,197,300** | **69,883,682** | **91.71** | **87,110,000** | **81,821,452** | **93.92** |

මූලාශ්‍රය : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව